පොදු උපදෙස් පත්‍රිකා :- 04/2020

මගේ අංකය- දපස/සමු.සං/සං/18
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2020.12. 07

සියළුම විවිධ සේවා සමුපකාර සමිතිවල,
ගරු සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්/ ලේකම්,

**විවිධ සේවා සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එහි කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධවයි.**

විවිධ සේවා සමුපකාර සමිති වල කළමණාකරණ හා පරිපාලන කටයුතු සම්බන්ධ තීරණ ගැනීම එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නෛතික රාමුවට යටත්ව නිසි පරිදි පැවැත්වීම හා එහිදී ගනු ලබන තීරණ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වේ.

02. එබැවින් විවිධ සේවා සමුපකාර සමිතිවල කටයුතු නිසි පරිදි සිදු වීම සහතික කිරීම සඳහා මා විසින් සෑම විවිධ සේවා සමුපකාර සමිතියක් සඳහාම සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරිවරයෙකු පත් කර ඇති අතර සමිතියේ පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඔහුට/ ඇයට සහභාගී වන ලෙස ආරාධනා කිරීම සමිතියේ ලේකම්ගේ/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ වගකීමක් වේ.

03. තවද මාගේපොදු චක්‍රලේඛ/02/2018 හි 8(ii) ඡේදයේ සඳහන් "මාගේ අනුමැතිය ලබා ගත යුතු කාර්යයක් සම්බන්ධයෙන් තීරණ ලබා ගන්නා අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා රැස්වීම සඳහා සමිතිය භාර සමුපකාර සංවර්ධන නිලධාරී අනිවාර්යයෙන්ම සහභාගී කරවා ගත යුතු අතර එසේ නොවන අධ්‍යක්ෂ මණ්ඩල/ කාරක සභා රැස්වීමකදී ගනු ලබන තීරණ මත මවිසින් අනුමැතිය සඳහා සලකා නොබලන බව අවධාරණය කරමි." යන කරුණ කෙරෙහි ඔබගේ අවධානය නැවත යොමු කරමි.

04. මං විසින් මීට පෙර චක්‍රලේඛ මගින් උපදෙස් ලබාදී ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු අතර, එලෙස පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් පවත්වන ලෙස මෙයින් දන්වමි.

- මං විසින් මීට පෙර චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් වලට යටත්ව අවශ්‍යතාවය අනුව මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.

- සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම නියමිත ආකාරයේ වන කැඳවීමක් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා සමිතිය භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත සිදු කිරීම සමිතියේ ලේකම්ගේ/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ වගකීමක් වන අතර එම දැන්වීම මගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පවත්වනු ලබන දිනය, වේලාව හා ස්ථානය ප්‍රමාණවත් කාලයකට පෙර දැනුම් දීම සිදු කල යුතුය. (මේ වන විට රට තුළ පවතින COVID 19 රෝගී ව්‍යාප්තිය සලකා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් රැස්වීම පැවැත්විය යුතු අතර, රැස්වීම් කැඳවීම සඳහා සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඇති කර ගනු ලබන එකගතාවයන්ට අනුව සුදුසු මාධ්‍යක් භාවිතා කල හැකි වේ. නමුත් සුවිශේෂී නෛතික තීරණ ගනු ලබන අවස්ථාවකදී එකී ක්‍රමවේදයට අමතරව ලිඛිතව දැනුම්දීමේ පටිපාටිය අනුගමනය කල යුතුය.)

- මා විසින් ඔබ සමිතිය සඳහා පත් කර ඇති සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරිවරයාට ඔබ සමිතියට අමතරව සමිති බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ස.ණ.ස/ ධීවර/ පාසැල් හා වෙනත් සියළුම ආකාරයේ සමුපකාර සමිති වල කටයුතු අධීක්ෂණය හා සංවර්ධනය පවරා ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම

පැවැත්වීමේදී ඔවුනට සහභාගි විය හැකි වන පරිදි දින හා වේලාවන් වෙන් කර ගැනීමට කටයුතු කිරීම වඩාත් සුදුසු වේ. ඒ සඳහා අවශ්‍ය කටයුතු සමිතියේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සිදු කිරීම යෝග්‍ය වේ.

- ➢ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉහත දක්වන ලද සාමාජිකයන්ට අමතරව සමිතියේ සාමාන්‍යාධිකාරී කැඳවිය යුතු වන අතර අවශ්‍ය වන පරිදි අනෙකුත් විධායක නිලධාරීන්ද රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි කැඳවීම සමිතියේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සිදු කල යුතුය.

- ➢ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාම සඳහා එම රැස්වීමේදී සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනු ලබන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පූර්වයෙන් දැනුවත්ව සිටීම අත්‍යවශ්‍ය වන අතර එහිදී ගනු ලබන තීරණ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල සිදු කල යුතු ආකාරය පිළිබඳ සමිතියට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා අදාල කරුණු පිළිබඳව සමිතිය භාර සංවර්ධන නිලධාරීද දැනුවත්ව සිටීම අත්‍යවශ්‍ය වේ. එබැවින් එම රැස්වීම් සඳහා සහභාගී වන සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා සමිතිය භාර සංවර්ධන නිලධාරිවරයාට එම රැස්වීමට අදාල න්‍යාය පත්‍රය, රැස්වීම කැඳවනු ලබන දැන්වීම සමග යොමු කිරීම හෝ වෙනත් කුමන හෝ ක්‍රමයක් මගින් රැස්වීම පැවැත්වීම ප්‍රමාණවත් කාලයකට පෙර යොමු කිරීමට සමිතියේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කල යුතු අතර එකී න්‍යාය පත්‍රය සමග ඊට පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ වල සංක්ෂිප්ත වාර්තාවක්ද යොමු කල යුතුය.

- ➢ තවද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඊට පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ පිළිබඳ සමාලෝචනයක් පළමුව සිදු කල යුතු අතර ඒ සම්බන්ධයෙන් වන ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කල යුතුවේ.

- ➢ සුවිශේෂී අවස්ථාවක හැර සෑම විටම ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පවත්වනු ලබන දිනය හා වේලාව එම රැස්වීමේදීම තීරණය කල යුතු අතර, එදින රැස්වීම සඳහා නොපැමිණි නොපැමිණි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හටද රැස්වීම පවත්වනු ලබන දිනය හා වේලාව ඉහත දක්වා ඇති පරිදි දැනුම් දිය යුතු වේ. යම් අවස්ථාවක තීරණය කරන ලද දිනය හා වේලාව වෙනස් වන්නේ නම් පමණක් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා සමිතිය භාර සංවර්ධන නිලධාරියාට ඒ පිළිබඳව ඉහත පරිදි දැනුවත් කල යුතු වන අතර ඒ සම්බන්ධ සියළු වගකීම සමිතියේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත පැවරේ.

05. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කරන ලෙසත්, මෙම චක්‍රලේඛය පිළිබඳව සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් මෙයින් උපදෙස් ලබා දෙමි.

ආර්.ජී. කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ආර්. ජී. කන්නන්ගර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත-

01. ලේකම්, කෘෂිකර්ම ...සමුපකාර අමාත්‍යාංශය, ලබුදූව - කාරු. දැ.පි

02. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ගාල්ල/ මාතර/ හම්බන්තොට)- දැ.පි හා සමිති භාර නිලධාරීන් දැනුවත් කිරීම ඇතුළු අවශ්‍ය කටයුතු සඳහා